රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 51/89(I)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1989 නොවැම්බර් මස 23 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිසාපතිවරුන්
පළාත් පාලන ප්‍රාදේශීය කොමසාරිස්වරුන් වෙත.

**අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/පළාත් පාලන ආයතන/පළාත් සභා,**
**කාර්ය මණ්ඩල පිළිබඳ මූලික දත්ත**

1989 ඔක්තෝබර් මස 20 වැනි දින අංක 51/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවය.

02. රාජ්‍ය අංශය, පළාත් පාලන සේවා අංශය ආදී අංශවලින් නිලධාරීන් මාරු කිරීමෙන් පළාත් සභාවල කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ද, අතිරික්ත සේවක සංඛ්‍යා නිර්ණය කිරීම සඳහා ද මෙම අමාත්‍යාංශයේ කමිටුවක් පිහිටුවා ඇත. මෙම අමාත්‍යාංශයේ පෝ. වීරසූරිය මහතා ඊට සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් පත්කර ඇත. ඔහුගේ දුරකථන අංකය 693516.

03. කරුණාකර කාර්ය මණ්ඩල ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම සඳහා ඔබේ අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු තෝරාගෙන ඔහුගේ නම, නිල නාමය සහ දුරකථන අංකය දන්වා එවන්න. අංක 51/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් දැනටමත් ඉල්ලා ඇති තොරතුරු වලට අමතරව මෙම චක්‍රලේඛයේ දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළ තොරතුරු ද හැකිතාක් ඉක්මනින් හා කෙසේ වෙතත් 1989 දෙසැම්බර් 08 වැනි දිනට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවන්න. මෙම තොරතුරු <u>ඉතා හදිසි</u> බැවින්, තවදුරටත් කාලය දීර්ඝ කිරීමට පුළුවන්කමක් නැති බවත් කරුණාවෙන් සලකන්න.

04. අංක 51/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පිළිතුරු වශයෙන් දැනටමත් තොරතුරු සපයා ඇත් නම් එම තොරතුරු ලේඛනවල/ඔබගේ කාර්යාල පිටපත සමග සසඳා එහි දැක්වෙන දැනට සිටින සේවක සංඛ්‍යා පිළිබඳ දත්ත අනුව පලකා ඒ හා සම්බන්ධ කොට දැන් ඉල්ලා ඇති තොරතුරු සපයන්නේ නම් මැනවි.

අත්/කළේ: පී. එන්. එච්. ප්‍රනාන්දු
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

(එම්. එච්. පුනසිරි)
රාජ්‍ය පරිපාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
සහ අතිරේක ලේකම්

පිටපත:- රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත.
කේපී/23

යොමුව: රා.පරි. චක්‍රලේඛ අං. 51/89(I)

1989.10.31 දිනට සේවක සංඛ්‍යා දත්ත – අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/
පළාත් පාලන ආයතන/පළාත් සභා

අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් පාලන ආයතනය/පළාත් සභාව

| 1<br>* සේවය/පන්තිය/ශ්‍රේණිය | 2<br>*දැනට සිටින සේවක සංඛ්‍යාව (කරුණාකර සංඛ්‍යාව දක්වන්න) | 3.<br>1 තීරුවෙන් ආවරණය නොවන සංඛ්‍යාව (කරුණාකර කතතුරු වර්ග කරදක්වන්න) | 4<br>3 තීරුවෙහි සඳහන් සේවක සංඛ්‍යාව සේවා අනුව | 5<br>දිස්ත්‍රික්ක අනුව බෙදීයාම | 6.<br>වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව අනුමත කළ සේවක සංඛ්‍යාව | 7<br>(13 වැනි සංශෝධනය අනුව) පවරන ලද විෂයයන් සඳහා වෙන්කර ඇති සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

නිවැරදි බවට සහතික කරමි.

අත්සන : ..........................................

නම හා නිල නාමය : ..........................................

..........................................

* ලඝු ලේඛකයන්, යතුරු ලේඛකයන් සහ භාෂා පරිවර්තකයන් සම්බන්ධයෙන් කරුණාකර මාධ්‍යය දක්වන්න.

කේපී/23